සැ. යු.- 2010.02.19 දින පළ වූ අංක 1,642 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,643 - 2010 පෙබරවාරි මස 26 වැනි සිකුරාදා - 2010.02.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 310 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 312 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මාර්තු මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංඛක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 මාර්තු මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | හලාවත | හලාවත නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| එම | කල්පිටිය | කල්පිටිය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| එම | මුන්දලම | කන්දතොඩුවාව සින්නපාඩු කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ පුත්තලම් පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |

02-605

---

## ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුර

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) ගණයට අයත් විදුලි කාර්මික තනතුර/තනතුරු පුරප්පාඩුව සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වනු ලබන ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තෙහි පිළියෙළ කර ගත් අයදුම්පත් 2010.03.15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, තැ. පෙ. 854, කොළඹ 7 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "විදුලි කාර්මික තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

01. *විදුලි කාර්මික තනතුර.*—ඇබෑර්තු 01 (කොළඹ ජාතික කෞතුකාගාරයේ පමණි.)

1.1 වැටුප් ක්‍රමය :- (PL-2-2006A)මාසිකව
රු. 12,210-10x130-10x145-10x160-12x170-18600
(III, II, I හා විශේෂ ශ්‍රේණි අදාළ වේ)*

මෙම වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු. 12,210 හි පිහිටුවනු ලැබේ. (මෙම පරිමාණය හා ජීවන වියදම් දීමනාවද ඇතුලත්ව මාසික වැටුප් ගෙවනු ලැබේ.)

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ලබා ගෙන උසස්වීම් පරිපාටි සකස් කර උසස්වීම් ලබාදෙන තුරු බඳවා ගැනීමේ ශ්‍රේණියට අදාළ වැටුප රු. 12,210-10x130-13,510

1.2 *අවශ්‍ය මූලික සුදුසුකම් :-*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම;

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත වීම;

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ගේ උපරිම වයස් සීමාව බල නොපායි.)

1.3 අධ්‍යාපන සුදුසුකම්.—

(අ) ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සම්මාන 02ක් සහිතව අ. පො. ස. (සා/පෙළ)/ජා. පො. ස. විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකින් සමත්වීම. (එක්වරකදී විෂයයන් 05කින් සමත් විය යුතුය)

1.4 වෘත්තීය සුදුසුකම්.—
රජය පිළිගත් වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් විදුලි කාර්මික ශිල්පීය පිළිබඳව NVQ දෙවන මට්ටමේ එක් අවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන හෝ වසර දෙකකට නොඅඩු අර්ධකාලීන වෘත්තීය පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබිය යුතුය.

1.5 පළපුරුද්ද.—
විදුලි කාර්මිකයෙකු වශයෙන් රජයේ හෝ පෞද්ගලික ආයතනයක මාස 06ක් හෝ ඊට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

2. *බඳවා ගැනීමේ ක්‍රමය.—*

2.1 ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් සියලුම අයදුම්පත් පරීක්ෂා කර ඉහලම සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ විසින් තීරණය කරන පරිදි පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගෙන ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය—සාමාන්‍ය දැනීම - කාලය පැය 1
- ලකුණු 100
බුද්ධි පරීක්ෂණ්‍ය කාලය පැය 1/2 - ලකුණු 100

2.2 ලිඛිත පරීක්ෂණයෙන් ඉහලම ලකුණු ලැබූ අයදුම්කරුවන් විදුලිබල මණ්ඩල පුහුණු ආයතනය හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණයට ලකුණු 100ක් දෙනු ලබන අතර මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහලම ලකුණු ලබා ගන්නා අයදුම්කරු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබේ.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—*

3.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම මුලිකව තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව සිදු කරනු ලැබේ.

3.2 ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝග වලට යටත් විය යුතුය.

3.3 තනතුරට පත්වී වසර 3ක් ඇතුලත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය. වයස පදනම් කරගෙන මෙම විභාගයෙන් නිදහස් කරනු නොලැබේ.

3.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව බඳවාගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණ රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

3.5 අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) තම අයදුම්පතට අමුණා එවිය යුතුය. :
(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකයක්

3.6 රජයේ අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

3.7 පූජ්‍ය ස්ථානභාර පූජකවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, රජයේ විදුහල්පතිවරයෙකු හෝ රු. 2,40,360 ටනොඅඩු ආරම්භක වාර්ෂික වැටුපක් හිමි වැටුප් පරිමාණයක සේවය කරනු ලබන රජයේ නිළධාරියෙකු මගින් අයදුම්කරුගේ අත්සන සහතික කරවා ගත යුතුය.

3.8 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් නොඑවන අයදුම්පත්, අදාල සහතික වල පිටපත් රහිතව එවනු ලබන අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් නොඑවන අයදුම්පත් හා අදාල ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් ගැනද දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

—————.
ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ.

2010 පෙබරවාරි මස 08 වැනි දින,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ විදුලි කාර්මික තනතුර සඳහා අයදුම් පත්‍රය**

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. මුලකුරු සමග නම :—————.
i. සිංහලෙන්/දෙමළෙන් :—————.
ii. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :—————.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම :—————.
i. සිංහලෙන්/දෙමළෙන් :—————.
ii. ඉංග්‍රීසියෙන් (IN BLOCK LETTERS) :—————.

02. i. පෞද්ගලික ලිපිනය :—————.
ii. දුරකථන අංකය :—————.
iii. දිස්ත්‍රික්කය :—————.

03. රාජකාරී ලිපිනය (රැකියාවක් කරන්නේ නම්) :—————.

04. උපන් දිනය :—————.

15.03.2010 දිනට වයස අවු. :———. මාස :———. දින :———.

05. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

06. ස්ත්‍රී/පුරුෂභාවය :—————.

07. විවාහක/අවිවාහක බව :—————.

08. ජනවර්ගය :————.

09. පුරවැසිභාවය : පරම්පරාවෙන් ☐ ලියාපදිංචිකරුවන් ☐

10. අධ්‍යාපන සුදුසුකම් :

I. අ. පො. ස. (සා/පෙළ) විභාගය

*විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍ය :————.*

| *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|
| (1) ............................ | .............. |
| (2) ............................ | .............. |
| (3) ............................ | .............. |
| (4) ............................ | .............. |
| (5) ............................ | .............. |
| (6) ............................ | .............. |
| (7) ............................ | .............. |
| (8) ............................ | .............. |

II. අ. පො. ස. (උ/පෙළ) විභාගය

විභාග අංකය :————. වර්ෂය :————. මාධ්‍ය :————.

| *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* |
|---|---|
| (1) ............................ | .............. |
| (2) ............................ | .............. |
| (3) ............................ | .............. |
| (4) ............................ | .............. |

III. වෘත්තීය දැනුම හා කුසලතාවන් පිළිබඳ විස්තර :

| *පාඨමාලාව* | *ආයතනය* | *විෂයයන්* | *ප්‍රතිඵල* |
|---|---|---|---|
| | | | |

*සැ. යු.-සියලු සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.*

11. පළපුරුද්ද පිළිබඳ විස්තර

| *තනතුර* | *ආයතනය* | *සේවයේ නියුක්තව සිටි කාලය* |
|---|---|---|
| | | |

12. දැනට යම්කිසි තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

i. තනතුර සහ ශ්‍රේණිය :————.
ii. පත් වූ දිනය :————.
iii. ආයතනය :————.
iv. විශ්‍රාම වැටුප් සහිතද යන වග :————.

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත් කිරීමෙන් පසු අසත්‍ය බව වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ............................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන තබන ලද බවත් සහතික කරමි.

————.
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

**රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.............................මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
හෝ බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය :————.

02-607

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වැනි පන්තියේ නිලධාරීන් විශේෂ පන්තියට උසස් කිරීමේ විභාග - 2010

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වැනි පන්තියේ සිට විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2010 මැයි මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. i. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

ii. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත. අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති, ගැසට් නිවේදනයේ මූල වෙනම මුද්‍රණය කර ඇත.

03. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව රාජ සේවයේ නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්ද, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ඔවුන් සේව කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් මගින්ද, 2010 මාර්තු මස 26 වැනි දින නොඉක්මවා, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනය වෙත තම අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *හැඳුනුම්පත් :*

විභාග ශාලාවේ දී තමන් පෙනී සිටින එක් එක් විෂයය සඳහා ශාලාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත්‍රය.;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවංලගු කළ හැකිය.

05. *අයදුම්පත්‍රය :*

(i) " ඒ4 " ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 තෙක් පළමු පිටුවට ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අපේක්ෂක/අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතුය.

ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල හා දෙමළ ඉල්ලුම්පත්‍රවල අදාළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද යෙදිය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න අයදුම්කරු විසින්ම විමසා බැලීමට කටයුතු කළ යුතුය. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම වඩාත් සුදුසු වේ.

(ii) අපේක්ෂකයින්ට තම අයදුම්පත්‍රයේ සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන්ම විභාගය පවත්වනු ලබන අතර අපේක්ෂකයින් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුවේ.

(iii) පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් රු. 200 ක් වටිනා මුද්දර අයදුම්පත්‍රයේ අලවා තම අත්සන සහ දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය. මොනම කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

06. අයදුම්පත් එවා ඇති සියලුම නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කල යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2/3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනය වෙත පහත සඳහන් විස්තර සමග (විදුලි පණිවුඩ ලිපිනය - විභාග, කොළඹ) අප්‍රමාදව ලියා දැන්විය යුතුය.

(i) විභාගයේ නම
(ii) අයදුම්කරුගේ/කාරියගේ සම්පූර්ණ නම
(iii) සම්පූර්ණ ලිපිනය
(iv) ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය හා යැවූ දිනය

ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

07. ඉහත (06) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

08. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :*

අංක 03 යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ද, රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ප්‍රතිඵල අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

09. *විභාග පරිපාටිය :*

(i) I පන්තියේ නිලධාරීන් විශේෂ පන්තියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

(1) අභියෝග්‍යතාව - විෂය අංකය (1) කාලය පැය 1 කි-ලකුණු 100 යි.

(2) කළමනාකරණය - විෂය අංකය (2) කාලය පැය 3කි-ලකුණු 100 යි.

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුවේ.

පළමු ප්‍රශ්නපත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ. :

අභියෝග්‍යතාව - විෂය අංකය (1)

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය හා විශ්ලේෂණාත්මක හැකියාවත්, තීරණ ගැනීමේ ශක්තියත් මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සකස් වනු ඇත.

දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ. :

කළමනාකරණය - විෂය අංකය (2)

(i) කළමනාකරණ මූලධර්ම
(ii) කළමනාකරණ ශ්‍රිතයන්
 සැලසුම් කිරීම
 තීරණ ගැනීම
 තීරණ ගැනීමේ ක්‍රියාවලිය
 සංවිධානය
 මාණ්ඩලීකරණය
 මෙහෙයවීම
 අභිප්‍රේරණ ක්‍රියාවලිය
 නායකත්වය
 පාලනය
 පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය
(iii) සහභාගීත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

10. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

11. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාපාඨ අතර යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවත්වන්නේ ය.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 පෙබරවාරි මස 09 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වැනි පන්තියේ නිලධාරීන් විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය — 2010**

Examination for the Promotion of the Officers in Class I of Sri Lanka Technological Service to Special Class - 2010

01 (අ) මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A. B.
(ආ) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ඇ) මුල'කුරු සමඟ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(ඈ) රාජකාරී ලිපිනය : (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)
(ඉංග්‍රීසියෙන්) :————.
(සිංහලෙන්) :————.
(ඉ) විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(සිංහල - 2/ දෙමළ - 3/ ඉංග්‍රීසි - 4) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(ඊ) ස්ත්‍රී/පුරුෂ භාවය :
(පුරුෂ - 0/ ස්ත්‍රී - 1) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(උ) ජාතික හැඳුනුම්පත් අංකය :

02. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, රාජ්‍ය සේවයට ද යන වග : (අදාළ අංකය කොටුව තුළ ලියන්න).
(රාජ්‍ය සේවය - 1/ බස්නාහිර-2 / දකුණු - 3/ මධ්‍යම 4/ වයඹ - 5/ සබරගමුව - 6/ ඌව - 7/ උතුරුමැද - 8/ උතුර - 9/ නැගෙනහිර - 10)

03. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :————.

04. පදවි නාමය :————.

05. (i) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
(ii) 2010.01.01 දිනට වයස : අවු. : මාස : දින :

විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට නොවේ නම් රු. 200 වටිනා මුද්දර අලවා තම අත්සන සහ දිනය යොදා අවලංගු කරන්න.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ තමාගේ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ...............................................

මහතා/මහත්මිය/මෙනෙවිය ......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අංක 01 සිට 05 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, නියමිත විභාග ගාස්තුව සඳහා මුද්දර අලවා අත්සන හා දිනය යොදා ඇති බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදිවි නාමය.

දිනය :————.

02-604

---

**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය

**සත්ව පාලන දෑඅවුරුදු ඩිප්ලෝමාව**

මෙම දෙපාර්තමේන්තුවේ කුණ්ඩසාලේ ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය මඟින් පවත්වනු ලබන දෑඅවුරුදු සත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. *ඩිප්ලෝමා පාඨමාලාවේ විස්තර :*

1.1 මෙම පාඨමාලාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

1.2 මෙම ඩිප්ලෝමා පාඨමාලාව වෘත්තීය පුහුණු වැඩසටහනක් වන අතර, මෙම පුහුණුව ලැබීමෙන් පසුව ස්වයං රැකියාවල නිරතවීමට හෝ සුදුසු රැකියාවක් ලබාගැනීම අරමුණ වේ. පුහුණුවෙන් පසු රැකියා ලබාදීමට මෙම දෙපාර්තමේන්තුව බැඳී නැත.

1.3 පුහුණුව ලබන කාලය තුළ දී සිසුන්ට නේවාසික පහසුකම් ලබාදෙන අතර, ආහාර පාන සිසුන් විසින් සපයාගත යුතුව ඇත.

1.4 සෙනසුරාදා හා ඉරිදා යන දිනවල ද සමහර විට පන්ති පවත්වන බැවින්, නේවාසිකාගාරවලින් බැහැරව යවන්නේ මසකට එක් සති අන්තයකදී පමණි.

02. *බඳවා ගැනීම.-* පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලිඛිත සහ සම්මුඛ පරීක්ෂණ මඟිනි. ලිඛිත පරීක්ෂණය සඳහා පහත සඳහන් විෂයන් යටතේ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුය. කාලය එක් ප්‍රශ්ණ පත්‍රයකට පැයක් බැගිනි.

(i) *සත්ව පාලනය :* අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශයේ සත්ව පාලනය කොටසට අදාළව සකස් කරන බහුවරණ හා කෙටි ප්‍රශ්න අඩංගු වේ.

(ii) *සාමාන්‍ය දැනීම :*

පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන මාධ්‍යයෙන් තෝරාගැනීමේ විභාගයට පෙනී සිටීම අනිවාර්ය වේ.

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන්නේ නම් ඉහත සඳහන් ප්‍රශ්ණ පත්‍ර දෙකට අමතරව ඉංග්‍රීසි ප්‍රශ්ණ පත්‍රයකට ද පෙනී සිටිය යුතුය. කාලය පැය 01 කි. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශය ඇසුරින් ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

03. සුදුසුකම් :-

3.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

3.2 අයදුම්කරුවන් 2010.03.31 වැනි දිනට වයස අවුරුදු 17 ට නොඅඩු සහ අවුරුදු 25 ට නොවැඩි විය යුතුය. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

3.3 පහත සඳහන් අවම අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය වේ.

3.3.1 භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට ද සම්මාන සාමාර්ථ (04 ක්) සහිතව විෂයන් 6 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම; සහ

3.3.2 භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, (උද්භිද විද්‍යාව/සත්ව විද්‍යාව) කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් තුනක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් අවස්ථාවකදීම සමත් වී තිබීම සාමාන්‍ය ඉංග්‍රීසි විෂයක් වශයෙන් නොසැලකේ.

3.3.3 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම්, අ.පො.ස (සා. පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතු අතර අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සමත්වී තිබිය යුතුය.

ඉල්ලුම් පත්‍රයට අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති ඉල්ලුම්පත් භාරගනු නොලැබේ. සියළුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

04. යම් අයදුම්කරුවෙකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බැව් තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත්, ඔහුගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටවනු ලැබීමට යටත් වනු ඇත. තව ද, ඔහුගේ පුහුණුව සඳහා රජය මඟින් ඒ වන විට දරා ඇති සියළු වියදම් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවීමටද ඔහු බැඳී සිටින්නේය. වියදම් ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුය.

05. ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන්නන් මෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර 2010.03.31 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ, අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. විභාග ගාස්තු වශයෙන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කළ පේරාදෙණිය තැපැත් කාර්යාලයෙන් මුදල් කර ගත හැකිවන සේ ලබාගත් රු. 150 ක මුදල් ඇණවුමක් ද ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ " සත්ව පාලන ඩිප්ලෝමාවට ඇතුළත්වීම" යනුවෙන් සඳහන් කල යුතුය. ඉල්ලුම් පත්‍ර අයදුම්කරු විසින් පැහැදිලිවම පිරවිය යුතුය.

06. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

***ඉල්ලුම් පත්‍රය***

*සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*
*ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය,*
*සත්ව පාලන දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව*

විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය : | | | |

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
02. භාවිතයේ යෙදෙන අයුරු මුලකුරු සමග නම :————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————.
04. ලිපිනය :————.
05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
    දිස්ත්‍රික්කය :————.
06. උපන් දිනය : අවුරුද්ද :——. මාසය :——. දිනය :——.
07. 2010.03.31 වැනි දිනට වයසඃ අවුරුදු :——. මාස :——. දින :——.
08. ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :————.
09. (i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| *විෂයයන්* | *සාමාන්‍ය/සම්මාන/විශිෂ්ට* | *වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |
| 9. | | | |
| 10. | | | |

(ii) අ.පො.ස. (උ. පෙළ)

| *විෂයයන්* | *සාමාන්‍ය/සම්මාන/විශිෂ්ට* | *වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත).

10. මුදල් ගෙවූ තැපැල් කාර්යාලය හා මුදල් කුවිතාන්සි අංකය :——.
    (මුදල් ඇණවුම ගලවා ගත හැකිවන පරිදි අමුණන්න)
11. අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසල/ආයතනය :————.
12. පාසලෙන්/ආයතනයෙන් අස්වූ දිනය :————.
13. සත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
    (සහතික පිටපත් ඇමිණිය යුතුය)
14. ග්‍රාම සංවර්ධන/කෘෂිකාර්මික/සමාජ සේවා/ක්‍රීඩා පිළිබඳ පළපුරුද්ද:————.
    (සහතික වල පිටපත් ඇමිණිය යුතුය)
15. අයදුම්කරු පිළිබඳ විමසිය හැකි දෙදෙනෙකුගෙ නම් සහ ලිපිනයන්
    1. ————.
    2. ————.

ඉහත දැක්වෙන විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍යවූ ද, නිවැරදිවූ ද, තොරතුරු බව මගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරා ගත් පසු අසත්‍ය තොරතුරක් හෙළිදරව් වුවහොත්, මාගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බවද, පුහුණුව ලබන කාලයේ දී මා වෙනුවෙන් රජයට යම් මුදලක් දැරීමට සිදුවී නම්, එම මුදල ගෙවීමට ද මම බැඳී සිටින බව ද දන්වමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන* : මෙම අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛන

1. ————.
2. ————.
3. ————.

02-500

---

**කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය**

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2010

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරි තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *තනතුරෙහි ස්වභාවය.*- රැකියා විරහිත තරුණ තරුණියන්ට වෘත්තීය වරණයට හා වෘත්තීය සංවර්ධනයට මග පෙන්වීම, වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම, වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් පර්යේෂණ හා තොරතුරු රැස් කරමින් ඒ සම්බන්ධ පතපොත ප්‍රකාශයට පත් කිරීම, ශ්‍රම වෙළඳපල අවශ්‍යතා අනුව රැකියා අපේක්ෂකයින්ට රැකියා සපයා දීමට සහය වීම, ස්වයංරැකියා සඳහා යොමු කිරීම හා පහසුකම් සැලසීම සහ වෘත්තීය උපදේශනය වැනි රාජකාරි ඉටු කිරීම වේ.

03. තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම් පත්‍රයේ විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගර හා නගර අංක මෙම වගුවට අනුව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කෙසේ වෙතත් ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් යම් නගරයක් සඳහා ඉල්ලුම් කර නොතිබුණහොත් එම අයදුම්කරුවන් ඊට ආසන්න නගරයක් වෙත යොමු කරනු ඇත.

| නගරය | නගර අංක | නගරය | නගර අංක |
|---|---|---|---|
| කොළඹ | 01 | කුරුණෑගල | 06 |
| මහනුවර | 02 | අනුරාධපුර | 07 |
| මාතර | 03 | මඩකලපුව | 08 |
| බදුල්ල | 04 | යාපනය | 09 |
| රත්නපුර | 05 | වව්නියාව | 10 |

04. *ඉල්ලුම් කළයුතු පිළිවෙල*.-ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් ඉදිරිපත් කළ යුතුය.

ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද, 08 සිට 13 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තෙවන පිටුවට ද වන ලෙස ගෙන ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(I) රජයේ/සංස්ථා/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සිය ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. එසේ අයදුම්පත් එවන විට අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය බවටත් ආයතන ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

(II) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.04.01 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලේකම්, කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය, කම්කරු මහ ලේකම් කාර්යාලය, 2 වන මහල. නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් යනුවෙන් සඳහන් කර එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර සෑම ආකාරයකින් ම සම්පූර්ණ හා නිවැරදි විය යුතුය.

(III) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා ගැසට් නිවේදනයට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට කරන පැමිණිලි සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

(IV) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2010.04.01 වේ.

5. *වැටුප් ක්‍රමය* :

රු. 15,215 - 10x215-4x240-7x320-15x360-රු. 25,965 මාසිකව (06/2006(iv) රා. ප. ච. අනුව) (තනතුරට පත්ව වසර තුනක් ඉක්මවීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

06. *වයස් සීමාව*.-වයස අවු. 22-45 ත් අතර විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

07. (i) *අධ්‍යාපන සුදුසුකම්*.-අයදුම්කරුවන්ට පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් තිබිය යුතුය.

(ii) *වෙනත් සුදුසුකම්* :

1. පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම
2. වෘත්තීය මාර්ගෝපදේශය හා උපදේශනය පිළිබඳ දැනුවත්භාවය

08. *බඳවා ගැනීමේ ක්‍රමය*.-විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හමුවට පමුණුවා ලකුණු ප්‍රදානය කර එම ලකුණු හා තරග විභාගයේ ලකුණුවල එකතුවේ වැඩිම ලකුණු අනුපිළිවෙලට පවතින පුරප්පාඩු සඳහා පමණක් තෝරා ගැනීම සිදුකරනු ලැබේ.

09. *විභාග මාධ්‍යය සහ විභාගය සඳහා වන විෂය නිර්දේශය*.-විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කරනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර 03කින් සමන්විතය.

*විෂය අංක* 01 - අවබෝධය - කාලය පැය 02 යි.
ලකුණු 100 යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. I කොටසට රචනයක් සහ සාරාංශයක් ලිවීම ඇතුළත් වේ. භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨයන් කිහිපයකින් II වැනි කොටස සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගේ අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ විකල්පයන් කාණ්ඩයකින් වඩාත් උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා උත්තර කිහිපයක් අතරින් නිවැරදි උත්තරය තෝරා දක්වන ලෙස අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.

*විෂය අංක* 02 - බුද්ධි පරීක්ෂණය - කාලය පැය -1 යි
ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය සහ නිවැරදි ව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

*විෂය අංක 03* - විෂයානුබද්ධ අවබෝධය-කාලය පැය 03 යි. ලකුණු 100 යි.

පුද්ගලයාට ස්වයං තක්සේරුවක් කර තම විභව ශක්තීන් හඳුනාගෙන ඊට අදාළ අධ්‍යාපන වෘත්තීය පුහුණු අවස්ථා තෝරා ගැනීමටත්, වෘත්තියකට පිවිසීමට පැවැතීමට හා වෘත්තීය සංවර්ධනය සඳහා මග පෙන්වීම යටතේ-

(i) වෘත්තීය මාර්ගෝපදේශ පිළිබඳ විවිධ නිර්වචන හා මූලික සංකල්ප පිළිබඳ අවබෝධය
(ii) වැඩ ලෝකය පිළිබඳ අවබෝධය
(iii) ශ්‍රම වෙළඳපල ප්‍රවණතා පිළිබඳ අවබෝධය
(iv) කළමනාකරණය පිළිබඳ නිර්වචන, මූලික සංකල්ප හා ඒවා ප්‍රායෝගිකව යොදා ගැනීම.
(v) විවිධ ආයතන හා පුද්ගලයන් සම්බන්ධීකරණය ඉටු කරන්නකු සතු දැනුම හා කුසලතා

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය
(ii) රජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ නියමයන් හා කොන්දේසි අදාළ වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු කාලසීමාවක පරිවාස කාලයකට යටත්වනු ඇත.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 04 වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නාවූ හා මින්මතු පවත්වනු ලබන්නාවූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරන බවට ඔබ එකඟ විය යුතුය.

(v) සේවය ස්ථිර කරනු ලැබීමට පෙර සෑම නිලධාරියකුම නියමිත පරීක්ෂණවලින් සමත්විය යුතුය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

11. *විභාග ගාස්තු*.-මෙම විභාගය සඳහා ආපසු නොගෙවන රුපියල් 300ක විභාග ගාස්තුවක් අය කෙරේ. එම විභාග ගාස්තුව කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ ලේකම් ගේ අදායම් ශීර්ෂ 2003-90-00ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*:—ඉල්ලුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥයකු හෝ රා. ප. ච. 6/2006(iv) අනුව රු. 20,030 මාසික ආරම්භක ඒකාබද්ධ වැටුපක් හෝ ඊට වැඩි ආරම්භක වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

14. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

15. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

17. මෙහි සඳහන් නොවන කරුණු පිළිබඳව අවසාන තීරණයන් ගැනීම කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

මහින්ද මඩිහහේවා,
ලේකම්.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය,
2 වන මහල,
කම්කරු මහ ලේකම් කාර්යාලය.
නාරාහේන්පිට,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

☐

***කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2010***

***Competitive Examination for Recruitment of Carrier Guidance Officers in Ministry of Labour Relations and Manpower - 2010***

විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය ☐
(අදාළ අංකය කොටුව තුළ යොදන්න)
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

විභාගයට පෙනී සිටින නගරය ......... ☐ නගර අංකය
(නිවේදනයේ 03 වැනි ඡේදය බලන්න)

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—.
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

03. ස්ථිර ලිපිනය :
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසියෙන් :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0

05. පදිංචිය :
(i) ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය :————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(iii) දිස්ත්‍රික්කය :————.

06. ජන වර්ගය : ☐

(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

| | | | |
|---|---|---|---|
| සිංහල | - 1 | ඉන්දියා ද්‍රවිඩ | - 2 |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ | - 3 | බර්ගර් | - 4 |
| මුස්ලිම් | - 5 | මැලේ | - 6 |
| වෙනත් | - 7 | | |

07. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

08. පුරවැසිභාවය : (අදාළ කොටුවේ ✓ යොදන්න)

පරම්පරාවෙන් ☐ ලියාපදිංචි වීමෙන් ☐

09. (i) උපන්දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) 2009 .........දිනට වයස :

අවු. : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

10. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා. පෙළ)

පළමු වන වර දෙවන වර

වර්ෂය :————. ————.
විභාග අංකය :————. ————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| (i) ........................ | ............... |
| (ii) ........................ | ............... |
| (iii) ........................ | ............... |
| (iv) ........................ | ............... |
| (v) ........................ | ............... |
| (vi) ........................ | ............... |
| (vii) ........................ | ............... |
| (viii) ........................ | ............... |

(ii) අ. පො. ස. (උ. පෙළ)
වර්ෂය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| (i) ........................ | ............... |
| (ii) ........................ | ............... |
| (iii) ........................ | ............... |
| (iv) ........................ | ............... |

ලබාගත් උපාධිය :————.
වර්ෂය :————.
විශ්වවිද්‍යාලය :————.

11. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

12. වෙනත් සුදුසුකම් :————.

13. ඔබ කවරදා හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? ඔව් නම් විස්තර සඳහන් කරන්න ඃ

ඔව් [ ] නැත [ ]

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම් පත්‍රයේ මා විසින් පවසා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන්වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද දැන සිටිමි. ඉන් සිදුවන හානිය වෙතොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) .............. තැපැල් කාර්යාලයට රු. 300 ක් ගෙවා ලබාගත් අංකය ............... දරන ලදුපත පහත අලවා ඇත.

[ ]

(ඈ) මෙම කොන්දේසි පිළිගැනීමට මම එකඟ වෙමි.

(ඉ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. සේවා දායකයාගේ ප්‍රකාශය :

මෙමෙ කාර්යාලයේ සේවය කරන .......................... .................... මහතා/මිය/මෙනවිය ගේ අයදුම්පත සහතික කර මේ සමග අමුණා එවමි. ඔහු/ඇයට විරුද්ධ විනය කරුණු වාර්තා වී නැත. ඔහු/ඇයගේ වැඩ/හැසිරීම/පැමිණීම සතුටුදායකය. යම් හෙයකින් ඔහු/ඇය උක්ත විභාගයෙන් සමත්ව අදාළ තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට හැකිය/නොහැකිය.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :————.

තනතුර :————.

නිල මුද්‍රාව :————.

16. අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................. මහතා/මිය/මෙනවිය මා ඉතා හොඳින් හඳුනමි. නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ඉහත අත්සන මා ඉදිරියේදී තැබූ බවත් සහතික කරමි.

————.
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න).

02-582

## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය

### ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම - 2010/2011

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්‍ෂණික ආයතනය මඟින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්‍ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය නව පරිශ්‍රය, දියගම, හෝමාගම ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්වවිද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය :*

ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්‍ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

(අ) *නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (Set 1)*

(i) නාවුක ඉංජිනේරු තාක්‍ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්‍ෂණය

(ආ) *අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍රයන් (Set 2)*

(i) රසායන ඉංජිනේරු තාක්‍ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්‍ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්‍ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්‍ෂණය
(v) යාන්ත්‍රික ඉංජිනේරු තාක්‍ෂණය
(vi) පොලිමර් තාක්‍ෂණය
(vii) පේෂකර්ම හා ඇඟලුම් තාක්‍ෂණය

2. *යෝග්‍යතාවය :*

2.1 *වයස :*

(අ) 2009.12.31 වැනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 ට වැඩි නොවිය යුතුය.

(ආ) නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය හා නාවුක ඉංජිනේරු තාක්‍ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්‍ෂකයන් තෝරා ගැනීමේ දී 2009.12.31 දිනට වයස අවුරුදු 20 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්‍ෂණයකට හා සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2007, 2008 හෝ 2009 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතුය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම/ක්‍රියාපරිපාටිය :*

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :*

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මඟින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්‍ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරාගනු ලැබේ. (Z ලකුණු මත). 40% ක් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රය :*

යෝග්‍යතා පරීක්‍ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්‍ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්‍ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල :*

4.1 *අයදුම්පත් පෝරම :*

(i) *ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.*

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක ඃ
http ://www.mrt.ac.lk/itum

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම - 2010/2011" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
"නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්‍ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව".

(iii) තම ලිපිනය ලියන ලද රු. 40 ක් වටිනා මුද්දර අලවන ලද අඟල් 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

(iv) අයදුම්පත සමඟ සහතිකවල මුල්පිටපත් හෝ පිටපත් එවීම අවශ්‍ය නොවේ. එහෙත් අයදුම්පතේ සඳහන් තොරතුරු අදාළ පරිදි සහතික කර තිබිය යුතුය. (අයදුම්පතේ 03, 04 සහ 05 යන ඡේද බලන්න).

4.2 *අධ්‍යයන ක්‍ෂේත්‍රයන් තෝරා ගැනීම ඃ*

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.
(ii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.
(iii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩයේ දී, එනම් නාවුක ඉංජිනේරු තාක්‍ෂණය සහ නෞකා චලන අධ්‍යයන තාක්‍ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්‍ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්‍ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.
(iv) අනිකුත් ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්‍ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්‍ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්‍ෂේත්‍රය 07 ලෙසද සඳහන් කළ යුතුය.

5. (i) *ඉල්ලුම් පත්‍ර ගාස්තු ඃ*

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්‍ෂේත්‍රයක් සඳහා රු. 300 (තුන්සීයක්) හෝ ක්‍ෂේත්‍රයන් දෙකටම රු. 500 (පන්සීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 0000308280" දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010.03.31 දින වේ.

6. *යෝග්‍යතා පරීක්‍ෂණය ඃ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලඝු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

7. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම ඃ*

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්‍ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය ඃ

(i) අ. පො. ස. (උ. පෙළ) සහතිකය ;
(ii) අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සඳහන් සහතිකය ;
(iii)පාසැල හැරයාමේ සහතිකය ;
(iv)උප්පැන්න සහතිකය ;
(v) නමේ වෙනසක් ලියකියවිලිවල හා සහතිකපත්වල ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්.

8. *ඉතා වැදගත් ඃ*

(i) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්‍ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්වවිද්‍යාලය හැර).

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්‍ෂ,
තාක්‍ෂණික ආයතනය.

2010 පෙබරවාරි මස 12 වැනි දින,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

SPECIMEN APPLICATION FORM

| Application for Admission to the National Diploma in Technology Course<br><br>INSTITUTE OF TECHNOLOGY,<br>UNIVERSITY OF MORATUWA<br><br>Academic Year – 2010/2011 | *For office use only* |
|---|---|
| | Application No. |
| | District |

APPLICATION FOR (Please (✓ )

(1) MARITIME FIELDS - (SET 1) ☐
(2) OTHER FIELDS - (SET 2) ☐

[Applicants may apply for single set (Set 1 or Set 2) or both sets (Set 01 and Set 02)]

(Please use **BLOCK CAPITALS**)

01. PERSONAL DETAILS :

NAME IN FULL :

(Leave one blank cage between names)

NAME WITH INITIALS :

(Leave one blank cage between names)

| | | | | | |
|---|---|---|---|---|---|
| TITLE ▶ | Mr./Ms. | | SEX ▶ | Male/Female | | |
| Age: As at 31st Dec. 2009 | (Years) | (Months) | DATE OF BIRTH | Date | Month | Year |
| NATIONAL ID NUMBER | | | | | | |

02. CONTACT DETAILS :

ADDRESS (RESIDENCE):

(Leave one blank cage between different segments of the address)

| | | | |
|---|---|---|---|
| TELEPHONE | | MOBILE | |
| E-MAIL (if available) | | | |

03. RESULTS OF G. C. E. (ADVANCED LEVEL) EXAMINATION :

| *SUBJECTS & DETAILS OF EXAMINATION* | *GRADES & DETAILS OBTAINED AT THE* | | |
|---|---|---|---|
| | *1ST ATTEMPT* | *2ND ATTEMPT* | *3RD ATTEMPT* |
| *YEAR* | | | |
| PHYSICS | | | |
| CHEMISTRY | | | |
| COMBINED MATHEMATICS | | | |
| ADVANCED MATHEMATICS | | | |
| INDEX NUMBER | | | |
| Z-SCORE | . | . | . |
| MEDIUM | Sinhala/Tamil/English (Delete whatever is inapplicable) | | |
| RESULTS OF THE YEAR TO BE CONSIDERED FOR SELECTION (INDICATE WHETHER) 2007 OR 2008 OR 2009) ▶ | | | |

04. SCHOOL(S) ATTENDED FROM YEAR 11 TO YEAR 13

| *YEAR* | | *NAME & ADDRESS OF SCHOOL* | *DISTRICT* | *PERIOD OF ATTENDANCE* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | *FROM* | | | *TO* | | |
| | | | | *YEAR* | *M* | *D* | *YEAR* | *M* | *D* |
| 11 | | | | | | | | | |
| 12 | | | | | | | | | |
| 13 | 1ST ATTEMPT | | | | | | | | |
| | 2ND ATTEMPT | | | | | | | | |
| | 3RD ATTEMPT | | | | | | | | |

05. CERTIFICATION OF RESULTS AND SCHOOLS ATTENDED :

It is compulsory to certify the Results under No. 03 and Details under No. 04 in the application by the School Principal for the School Candidates, and by a Justice of Peace for External Candidates.

I certify that the particulars given above by the candidate in the cage No.3 and No. 4 are true and accurate according to the Original Certificates.

Name of the Principal/Justice of Peace : Rev./Dr./Mr./Mrs. ...................................................................................

Official Seal :………….

......................., .....................
Signature. Date.

06. FIELD PREFERENCE :

SET 1 - Insert order of preference as 1 for First preference and 2 for Second preference. This should be completed only by the candidates who have applied for Maritime Studies.

SET 2 - Insert order of preference as 1, 2, 3, 4, 5, 6, 7. ‘1’ for the "Most Preferred", ‘2’ for the next and so on ‘7’ for the last preferred.

*SET 1*

| *MARITIME FIELDS* | *ORDER* |
|---|---|
| MARINE ENGINEERING TECHNOLOGY | |
| NAUTICAL STUDIES AND TECHNOLOGY | |

STATE PRIORITY, IF APPLIED FOR BOTH SETS - ✓

| | |
|---|---|
| SET 1 | |
| SET 2 | |

*SET 2*

| *OTHER FIELDS* | *ORDER* |
|---|---|
| CHEMICAL ENGINEERING TECHNOLOGY | |
| CIVIL ENGINEERING TECHNOLOGY | |
| ELECTRICAL ENGINEERING TECHNOLOGY | |
| ELECTRONIC & TELECOMMUNICATION ENGINEERING TECHNOLOGY | |
| MECHANICAL ENGINEERING TECHNOLOGY | |
| POLYMER TECHNOLOGY | |
| TEXTILE & CLOTHING TECHNOLOGY | |

| | | |
|---|---|---|
| Are you registered as a fulltime student in any other University under the UGC (other than Open University) or any other Higher Educational Institution under the Ministry of Education ? (Delete whatever is inapplicable) | YES | NO |

*Applicant's Declaration* :

(i) I declare that I am not a fulltime registered student at any University (except Open University of Sri Lanka) or any Higher Educational Institution under the Ministry of Education.

(ii) I certify that all the particulars given by me in this Application are true and accurate. I am aware that if the particulars given by me in this Application are found to be false or inaccurate prior to my admission I will be discontinued from the course.

(iii) In the event of my being selected for admission after the Test, I shall abide by Statutes, By-Laws, Regulations and the Rules of the Institute of Technology, University of Moratuwa, in so far as they are applicable to me.

(iv) I have pasted the cash deposit/ Cash transfer receipt obtained from Bank of Ceylon, drawn in favour of "Institute of Technology, University of Moratuwa - Account No. 0000308280 of Bank of Ceylon, Katubedde Branch".

(v) I also enclose a Self addressed stamped envelope (Rs. 40 worth) in size 9" x 4".

(vi) I am aware that if I am found to be registered in another University or any other Higher Educational Institution under the Ministry of Education at the time of sitting for the Aptitude Test for the National Diploma in Technology Course, I will not be selected for the Course.

————————,
Signature of Applicant.

Date :————.

Paste your Cash Deposit/Cash Transfer Original Slip here.

02-728

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.